# 4 4. දිරිය දැරියක්

සරෝජාගේ තාත්තාගේ රක්ෂාව මුහුදු යාමයි. හිමිදිරියෙ ම මුහුදු යන ඔහු ආපසු ගෙදරට ළඟාවෙන්නෙ ගොම්මන් වෙලාවට. ඒ බරට ම මාළු අරගෙන. ඒත් මේ දිනවල සරෝජලා ඉන්නෙ හරිම දුකෙන්. ගිය මාසෙ මුහුදු ගිය තාත්තා තවම ආවෙ නැහැ. කිසිම ආරංචියකුත් නැහැ. අම්මා උදේ ඉඳල සවස් වන තුරු ම ලණු අඹරනවා. ඒත් සරෝජලාගෙ ජීවිතේ අඩුපාඩුකම්වලින් පිරිලා.

පාසල ඇරී ගෙදර පැමිණ ආ වෙලාවෙ ඉඳල ම සරෝජා කරන්නෙ පාඩම් වැඩ. චිත්‍ර ඇඳීම. සවසට තාත්තා එනතුරු මුහුද දිහා බලා ඉන්න එක. මුහුද ඔවුන්ගෙ ජීවිතය හා බැඳිලා. සරෝජා චිත්‍ර ඇන්දෙ මුහුද ගැන. ඒ අතර අම්මට උදවු කරන්නත් ඇය අමතක කළේ නැහැ.

එදා පාසලේ රැස්වීම දවස. විදුහල්පතිතුමා ළමයින් අමතා චිත්‍ර තරගයක් පැවැත්වෙන බව කිව්වා. පාසලේ සිටි දක්ෂ ළමයින් අතර සරෝජාත් එක් කෙනෙක්. ළමයි චිත්‍ර ඇන්දෙ ඉන්දියාවෙ ශංකර් චිත්‍ර තරගයට. චිත්‍ර තරගයෙන් දිනන අයට ඉන්දියාවට ගොස් තෑගි ලබා ගත හැකි බව චිත්‍ර ගුරුතුමී පැහැදිලි කළා. සරෝජා ඕනෑකමින් එය අහගෙන හිටියා. චිත්‍ර ගුරුතුමී ළමයින්ට චිත්‍ර ඇඳීමට උපදෙස් දුන්නා.

චිත්‍ර එකතු කරන දවස ළං වුණා. සරෝජාට චිත්‍රය පාට කිරීමට බැරි වුණා. ඒ පාට නැති හින්දා. සරෝජා පාට නැති බව ගුරුතුමීට කිව්වා. ගුරුතුමී පන්තියේ ළමයින් ඇමතුවා. ඔවුන්ගෙන් එකතු කර ගත් පාටවලින් සරෝජාට චිත්‍රය පාට කරන්න පුළුවන් වුණා. හැමදෙනා ම සරෝජාගෙ චිත්‍රය බලා සතුටු වුණා.



කාලය හෙමින් හෙමින් ගෙවී ගියා. එදා සරෝජා පාසල් ගියේ උදේ ආහාරය වත් නොගෙන. රැස්වීම්

වෙලාව ළංවුණා. චිත්‍ර ගුරුතුමී සරෝජා දිහා බලලා හිනාවුණා. රැස්වීමේ දී තමයි සරෝජා දන්නෙ එයා දිනාපු බව. මුළු ලංකාවෙන් ම පළමුවැනියා බව. සරෝජාට එක්වර ම සිහිවුණේ තාත්තා. අනේ තාත්තා හිටියා නම්! තාත්තා සිහිපත් වී සරෝජාගෙ ඇස් කඳුලින් බරවුණා.

සරෝජා චිත්‍ර ගුරුතුමිය සමග ඉන්දියාවට ගියා. ඇයට බරට ම තෑගි ලැබුණා. සහතික පත් ලැබුණා. පාසලට චිත්‍ර උපකරණත් ලැබුණා.

ඔහොම ටික දවසක් ගත වුණා.

එක් දවසක් හැන්දෑවක ගෙදරට එන අමුත්තකුගෙ පා ගැටෙන හඬක් ඇසුණා. සරෝජා පිල්කඩට වෙලා පොතක් කියවමින් යි සිටියෙ. මඳකට ඇය පොතෙන් හිස මෑතට ගත්තා. සරෝජාගෙ තාත්තා ඇය ඉදිරියේ. සරෝජා දෑසේ කඳුළු පුරවාගෙන තාත්තා වැළඳගත්තා.

සරෝජලාගේ ජීවිතය දැන් හරිම සතුටින් සැහැල්ලුවෙන් ගත වෙනවා.

සරෝජා පාසලේ දීප්තිමත් ළමයෙක්. ශිෂ්‍ය නායිකාවක්.

## ක්‍රියාකාරකම : 1

මෙම පාඩම ගුරුතුමිය කියවන විට හොඳින් සවන් දෙන්න. ඉන්පසු පහත ප්‍රශ්නවලට මතකයෙන් පිළිතුරු කියන්න.

i. සරෝජාගේ තාත්තා රැකියාව ලෙස කළේ කුමක්ද?
ii. ළමයි චිත්‍ර ඇන්දේ කුමන තරගයට ද?
iii. සරෝජාට චිත්‍රය පාට කරන්න පාට ලැබුණේ කොහොම ද?
iv. චිත්‍ර තරගයෙන් දිනූ සරෝජා තෑගි ගැනීමට ගියේ කොහේ ද?
v. සරෝජා දැඩි සතුටක් ලද අවස්ථා මොනවාද?

## ක්‍රියාකාරකම : 2

පහත සඳහන් සිදුවීම් අනුපිළිවෙළින් පෙළ ගස්වන්න.

* සරෝජා චිත්‍ර තරගයෙන් ප්‍රථම ස්ථානය ලැබීම

- ✷ තාත්තා නැවත ගෙදර පැමිණීම
- ✷ චිත්‍ර තරගය සඳහා ළමයින් ඉදිරිපත් වීම
- ✷ විදුහල්පතිතුමා පාසලේ රැස්වීම ඇමතීම
- ✷ සරෝජාට පන්තියේ ළමයින් උදවු කිරීම
- ✷ සරෝජාගේ තාත්තා මුහුදු රස්සාවට යාම
- ✷ සරෝජා, චිත්‍ර ගුරුතුමිය සමග ඉන්දියාවට ගොස් තෑගි ලබා ගැනීම
- ✷ ගුරුතුමිය සිසුන් අමතා චිත්‍ර තරගය ගැන කීම
- ✷ මුහුදු ගිය තාත්තා නොපැමිණීම

## ක්‍රියාකාරකම : 3

ඔබ සරෝජා යයි සිතා ලැබූ ජයග්‍රහණය පිළිබඳ දැන ගත් මොහොතේ ඇති වූ හැඟීම් පන්තියට ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම : 4

ඔබ ඇසූ හෝ දුටු හෝ වෙනත් මෙවැනි සිද්ධියක් කෙටියෙන් කියන්න.